www.xtrapapers.com



Diploma Programme
Programme du diplôme
Programa del Diploma

# Sinhalese A: literature – Standard level – Paper 1
# Singhalais A : littérature – Niveau moyen – Épreuve 1
# Singalés A: literatura – Nivel medio – Prueba 1

Friday 8 May 2015 (afternoon)
Vendredi 8 mai 2015 (après-midi)
Viernes 8 de mayo de 2015 (tarde)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

## Instructions to candidates

- Do not open this examination paper until instructed to do so.
- Write a guided literary analysis on one passage only. In your answer you must address both of the guiding questions provided.
- The maximum mark for this examination paper is **[20 marks]**.

## Instructions destinées aux candidats

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Rédigez une analyse littéraire dirigée d'un seul des passages. Les deux questions d'orientation fournies doivent être traitées dans votre réponse.
- Le nombre maximum de points pour cette épreuve d'examen est de **[20 points]**.

## Instrucciones para los alumnos

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un análisis literario guiado sobre un solo pasaje. Debe abordar las dos preguntas de orientación en su respuesta.
- La puntuación máxima para esta prueba de examen es **[20 puntos]**.



2215–0179

© International Baccalaureate Organization 2015

International Baccalaureate
Baccalauréat International
Bachillerato Internacional

www.xtrapapers.com



**මෙම ඡේද අතුරෙන් එකක් සඳහා සාහිත්‍යමය විවරණයක් සපයන්න. පහත දක්වා ඇති උපකාරක ප්‍රශ්න දෙකට පිළිතුරු ඇතුළත් වන සේ විවරණය ඉදිරිපත් කළ යුතුයි.**

**1.**

සුගුණවතී නිවසේ පඩිය උඩ වාඩි වී කල්පනා කරන්නට වී දැන් පැය හතරකට ත් වැඩි වන්නට ඇත. ඈත එපිට පොල් ඉඩමත් ඉන් මෙහා වෙල් යායත් වසාගෙන අඳුර පැතිරී එයි. පොල් ඉඩම අඳුරේ එතනට පේන්නේ කඳුවැටියක් මෙනි. සමහර තැනක උසටත් සමහර තැනක මිටියටත් පෙනේ. කපුටෝ විශාල රංචු වශයෙන් කා කා කියමින් එකම අතට වෙල් යාය කෙළවර වැව දෙසට ඉගිල යන්නේ ඔවුන් රෑ ළගින තැන් සොයා ගෙනය. ඉවරයක් නැති කපුටු ඕසය දෙස සුගුණවතී ටික වෙලාවක් බලා සිටියා ය. ‘අනේ ඒ සත්තුන්ට කිසිම තනියක් නෑ. කිසිම ප්‍රශ්නයක් නෑ’ යි ඇයට සිතිණ. ඇය පසුපස හැරී ගෙ තුළ දෙස බැලුවා ය. ගෙය අඳුරේ ය. පහන් දැල්විය යුතු ය. ඇගේ කකුල් හිරි වැටී ඇත. ඈ නැගිට කකුල බිම ඇන නැවත වාඩි වූවා ය.

‘මෙලහට ලොකු මල්ලි කඩුගන්නාවටත් ගිහින් ඇති. තේ බිබී තිලකා එක්ක සාකච්චා කරනවා ඇති ඉරිදා මෙහෙ පදිංචියට එන හැටි’ ඇයට සිතිණ.

නැනා මෙහි ආවිට ලොකු කාමරය ඇයට දිය යුතු යැයි සුගුණවතීට හැඟුණි. තමා තේ හදන අතර ලොකු මල්ලී ලොකු කාමරයට වී පරීක්ෂා කරන්නට ඇත්තේ එය තිලකාට හොඳ ද කියා විය යුතු ය. පසුව මිල දී ගත යුත්තේ කුමන විදියේ බඩුමුට්ටු ද කියා ඔහු තීරණය කරන්නට ඇත. තිලකාට දැන් බබෙකු ලැබීමට කිට්ටු බව සුගුණවතීට සිහි විය. ඇය වහා නැගිට අත පත ගා ගෙන ලොකු කාමරයට ගොස් කුප්පි ලාම්පුව දල්වා කාමරය හාත්පස හොඳින් බැලුවා ය. එහි වටිනා බඩුවකට තිබුණේ ඇගේ මහණ මැෂිම පමණි. ඈ රෙදි කැබල්ලක් ගෙන දූවිලි පිරී තිබූ මැෂිම නිකමට මෙන් පිස දැම්මාය. ඒ සමගම ඇගේ සිත යැවුණේ දූවිලි පිස දැමීමට ගත් රෙදි කඩමාල්ල දෙසය. ඒ ලොකු මල්ලී ඉස්කෝලෙ යන කාලෙ ඇන්ද කමිසයක කෑල්ලකි. ඒ කමිසය මහන ලද්දේ සුගුණවතී ම විසිනි. ඇගේ නෙතට කඳුළු බිඳුවක් නැගුණි. ලොකු මල්ලීගේ බාල කාලය ඇයට සිහිවී ය. ඒ සමගම ඇගේ සිතේ මැවී පෙනුනේ තව මාස කීපයකින් මේ කාමරය පුරා ම මේ පුංචි ගේ පුරාම දණ ගගා යන සිඟිත්තෙකි. තව ටිකක් වැඩුණු විට ඔහු සුදුවැලි මිදුලේ පුංචි අඩි ඔබමින් ඔබ මොබ දුවනු ඇත. තම ලොකු මල්ලීගේ පුතා තමාගේ පළමුවන බෑනා ගැන සිතන විට ඇගේ හදවත සෙනහසින් බර විය. ගේ පුරාම බිළිදෙකුගේ සිනා හඬ ඇසෙන්නාක් මෙන් විය. සුගුණවතී නැතිව ම බැරි තවත් කෙනෙක්; ඇගේ නෙතින් සට සට ගා කඳුළු බිඳු හැළිණ.

පියසීලි විජේමාන්න, *‘වෙලේ ගෙදර සුගුණවතී’* (1990)

(a) මෙම කොටසෙන් නිරූපණය වන අවස්ථාව කෙබඳු එකක් ලෙස විස්තර කළ හැකි ද?

(b) කතුවරිය සුගුණවතී මුහුණ පා ඇති තත්වය නිරූපණය කිරීමට අවට පරිසරය සහ භාෂා ශෛලිය කෙතරම් දුරට සාර්ථක ලෙස යොදා ගෙන ඇද්ද?

www.xtrapapers.com



**2.**

## උණු කඳුළ

කෙළවර නො දුටු කළු තිරයක් ඉදිරි පිට
මම තනි විණිමි ගහ බඩ රුක් වදුලු යට
මවගෙන් වියෝවුණු මේ දිවි පෙවෙත මට
ඊයේ මළ ගෙයකි, අද ගැටලුවකි හෙට

සුව සේ දිගාවී මවගේ දෙපය මුල
රසවත් සිහිනයෙක සැතැපී නිදන කල
මව මා හැර ගියා බිඳ ගෙන අඳුරු දැල
ඒ සුබ සිහින දැන් ඇත ඇට සැකිලිවල

මට හුරු වෙද්දි ගෙයි දුව පැන ඇවිදීම
සිදු විය පියාණන්ගේ පර ලොව යැම
මවගෙන් රැකුණු මම දුක සැප දැක සැම
පවුලෙක පියකු සතු බර නො දනිමි තාම

තනිව ම එතෙක් මට ගෙන යා නොහැකි දුර
උහුලා ගොස් මගේ මුළු ජීවිතේ බර
මවගේ බරක් මා උහුලන්නට ද පෙර
මව නිදහස් වුනා මම මෙහි විණිමි හිර

ලොවැටම පිළිකුලක් වී මට කියන නම
මා කොන් කළත් දුටු දුටු තැන්වල දී හැම
මවගේ සෙනේහය නොකැළැල් ගැඹුරුතම
සිහිනයෙකිනුදු නොසැලෙන බව දනිමි මම

ගිය හොත් මවට නොකියා කිසි තැනෙක පිට
එළිවෙන පැයේ හෝ මා එන තුරු ම ගෙට
නො නිවා පහන් දල්වා ගත් වන ම සිට
ළ තවයි මගේ මව මුළු ලොව නිදන විට

“නුනුවණ මගේ මතයට ඔබ එකඟ නැත
අලුතින් ඔබට මවුවරු දැන් සිටිති පුත”
යනුවෙන් දිනක් මව හෙළු උණු කඳුළ මත
මා ලත් එළිය මුළු ජීවිතයට මැ ඇත

නොකියමි සමන් ගිර යැ යි තුඹසකට කුඩා
මට වෙන කෙනෙකු හිටියේ නැහැ මවට වඩා
උහුලමි සිනා මුහුණින් කම්කටොලු විඩා
ජීවිතයෙන් අඩක් වැලැපෙයි තව ම අඩා

එච්.එම්. කුඩලිගම, *‘ඇ’ පද්‍ය සංග්‍රය* (1952)

(a) මෙම කවි පන්තියෙන් නිරූපණය වන්නේ කෙබඳු අවස්ථාවක් දැ යි පහදන්න.

(b) කවියා සිය අත්දැකීම සාර්ථකව නිරූපණය කිරීමට කෙතෙක් දුරට කාව්‍යමය රචනා උපක්‍රම මෙහි යොදා ගෙන ඇද්ද?